**ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය - 2017**

-----------------------------------------------

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනතේ අංක 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2018 ජුනි 30 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) හා (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02**

ප්‍රමිතයෙහි 40 වන ඡේදය ප්‍රකාරව පොළී ලැබීම් වලින් වන මුදල් ප්‍රවාහයන් එකිනෙක වෙනම හෙළිදරව් කළ යුතු වුවද වර්ෂයට අදාල පොලී ප්‍රමාණය රු.1,467,752 ක් හා පොලී මුදලට අදාල රදවාගැනීම් බදු රු.210,385 ක් හා වර්ෂයේ ආයෝජනය කල රු.10,000,000 ක ගෙවීම් ගැලපීම් කර මුදල ගලා යාමක් ලෙස රු.11,678,177 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

ප්‍රමිතයෙහි 69 ඡේදයේ ප්‍රකාරව වත්කමක ක්ෂය කිරීම ආරම්භ කළයුතු වන්නේ වත්කම භාවිතා කිරීම සඳහා සූදානම් තත්වයට පත් කිරීමෙන් පසුව වුවද ආයතනය විසින් ඉහත නියමයන්ට අනුකූල නොවන ලෙස මිලදී ගත් වර්ෂය සඳහාම ක්ෂය කිරීම හේතුවෙන් වර්ෂයේ ක්ෂය රු.280,819 කින් වැඩියෙන් දක්වා තිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09**

ආයතනය විසින් ප්‍රවර්ධන කටයුතු සඳහා රු.553,526 ක් වැයකර ටී ෂර්ට් මුද්‍රණය කර ඇති අතර ඒ සඳහා දරන ලද සම්පූර්ණ මුදලම වර්ෂයේ වියදම් ලෙස කපාහැර තිබුණි. 2017දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.181,322 ක් වටිනා තොගයක් ඉතිරිව තිබුණ අතර මෙම ප්‍රමිතයේ ඡේද 12 හි (ඌ) පරිදි ආයතනය විසින් එම ඉතිරි තොගය වර්ෂ අවසාන තොග ලෙස හඳුනා නොගැනීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය රු.181,322 කින් අඩුවෙන් දක්වා තිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 10**

ප්‍රමිතයෙහි ඡේද 19 ට අනුව සේවා සැපයීමෙන් ලැබෙන ආදායම හඳුනාගැනීමේදී වාර්තා කරන දිනට ගනුදෙනුවේ සමාප්ති තත්ත්වය සැලකිල්ලට ගතයුතු බව දක්වා තිබුණද, ආයතනය විසින් 2017 වර්ෂය තුළ පවත්වන ඩිප්ලෝමා පාඨමාලා වෙනුවෙන් රු. 7,263,000 ක මුදලක් ආදායම ලෙස ගිණුම්ගත කර තිබුණද එම ආදායම තුළ 2018 වර්ෂයට අදාල පාඨමාලා ආදායමද වර්ෂයට අදාල ආදායම ලෙස හඳුනාගෙන තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ආයතනයේ පාඨමාලා සහ වැඩසටහන් වලින් ලැබිය යුතු ආදායමෙන් වාර්ෂිකව මුදල් අයකරගත නොහැකි සහ පාඨමාලා නවතා දැමූ සිසුන්ගේ ලැබිය යුතු මුදල් අය නොවන අවස්ථා පැවතියද ආයතනය විසින් ඒ සඳහා අඩමාන ණය වෙන්කිරීමක් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2018 වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු දෙකක පොලී ආදායම වන රු.592,885 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ආ) ආයතනය වැටුප් ගිණුම්ගත කිරීමේදී දළ වැටුප වෙනුවට ශුද්ධ වැටුප ගැලපීම නිසා සේවක වැටුප් රු.349,694 කින් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුල අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සේවක අර්ථසාධක අරමුදලට අදාළව ආයතනය විසින් දරන සියයට 12 ක ප්‍රමාණය වන රු.524,541 ක් පමණක් ආයතනයේ වියදමක් ලෙස නිරූපණ කළ යුතු වුවත් සේවකයාගෙන් අඩු කරන ප්‍රතිශතය ඇතුළුව සියයට 20 ක ප්‍රමාණය වන රු.874,235 ක් වූ සේවක අර්ථසාධක අරමුදල් දායකය ආයතනයේ වියදමක් ලෙස නිරූපණය කර තිබීම නිසා රු.349,694 කින් වර්ෂයේ අතිරික්තය අඩු වී තිබුණි.

(ඈ) 2016 – 2017 වර්ෂයේ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ සිසුන් 10 දෙනෙකුට අදාල පාඨමාලා ආදායම ලෙස එක් අයෙකුගෙන් රු.77,000 බැගින් රු.770,000 ක් 2016 වර්ෂයේ ආදායම් ලෙස හඳුනාගෙන තිබුණි. එහෙත් සිසුන් පාඨමාලාව අතහැර දැමීම හේතුවෙන් තවදුරටත් ආයතනයට ලැබිය යුතු රු. 441,500 ක උපලබ්ධි නොවූ ආදායමක් ලෙස සමුච්චිත අරමුදලට ගැලපිය යුතු වුවත් රු.275,500ක මුදලක් පමණක් ගලපා තිබුණි.

### 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනතේ 17 වගන්තිය ප්‍රකාරව, පනතෙහි 4 උප වගන්තිය යටතේ දක්වා ඇති අරමුණ ක්‍රියාත්මක කිරීම සඳහා වෘත්තීය සමිති අධ්‍යයන අංශයක් පිහිටුවා නොතිබුණි.

**3.** **මූල්‍ය සමාලෝචනය**

-----------------------

**මූල්‍ය ප්‍රතිඵල**

-------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.5,149,301 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.329,186 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,820,115 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ආයතනයේ මෙහෙයුම් වියදම් රු. 7,550,935 කින් වැඩි වුවද මෙහෙයුම් ආදායම රු.9,884,139 කින් සහ භාණ්ඩාගාර පුනරාවර්තන ප්‍රදාන රු.2,486,912 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේදී රු.502,932 ක්වූ අතිරික්තය උච්චාවචනයක් සහිතව 2017 වර්ෂය වනවිට රු.5,149,301 දක්වා වර්ධනය වී තිබුණි. කෙසේ වුවද ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් සහ සේවක පාරිශ්‍රමික නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේදී රු.2,458,919 ක්වූ දායකත්වය 2017 වර්ෂයේදී රු.14,718,856 ක් දක්වා වර්ධනය වී තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

**4.1** **කාර්යසාධනය**

---------------

**4.1.1** **සැලසුම් කිරීම**

--------------

ආයතනය කෙටිකාලීන හා දිගුකාලීන දැක්මක් සහිතව කළමනාකරණය කළ යුතු බැවින් අවම වශයෙන් වර්ෂ තුනක කාලයක් සඳහා සංයුක්ත සැළැස්මක් පිළියෙල කර යෝජිත ඉලක්ක ලඟා කර ගැනීමට හැකිවන පරිදි කටයුතු කළ යුතු වුවත් එසේ සංයුක්ත සැළැස්මක් සකස් කර නොතිබුණි.

**4.1.2** **ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** පුස්තකාල හා තොරතුරු සැපයීමේ සේවා පිහිටුවීම හා ඒවා නඩත්තු කිරීම ප්‍රධාන අරමුණක් වුවද එම අරමුණු ඉටුකිරීම සඳහා පුස්තකාලයක් පැවතියද සිසුන්ගේ පරිහරණය සඳහා එය විධිමත් ලෙස පවත්වාගෙන යෑමට ආයතනය අපොහොසත් වී තිබුණි.

**(ආ)** ශ්‍රම අධ්‍යයනය පිළිබඳ සඟරා, ජර්නල, වාර ප්‍රකාශන සහ පොත් පල කිරීම ආයතනය පිහිටු වූ පනතේ අරමුණක් වුවද ඒ සඳහා උපායමාර්ගික වැඩපිළිවෙලක් ආයතනය සතු නොවීය.

**(ඇ)** 2017 ක්‍රියාකාරී සැලැස්මට අනුව පහත නිරීක්ෂණ කරනු ලැබේ.

- **i.** සමාලෝචිත වර්ෂයේ දී දායක (Donor funded) ව්‍යාපෘති 3 ක් සඳහා රු.මිලියන 1.5 ක් ඇස්තමේන්තු කර තිබූ නමුත් කිසිදු දායක ව්‍යාපෘතියක් සිදු කර නොතිබුණි.

- **ii.** සමාලෝචිත වර්ෂයේ දී ආයතනය විසින් පරීක්ෂණ ව්‍යාපෘති (Research project) දෙකක් සඳහා රු.මිලියන 1 ක් ඇස්තමේන්තු කර තිබුනි. නමුත් රු.මිලියන 1.2 ක් වැයකර පරීක්ෂණ ව්‍යාපෘති 1 ක් පමණක් සිදු කර තිබුණි. ආයතනය විසින් ලගා කර නොගත් ඉලක්කය සියයට 50 ක් විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ආයතනය විසින් පවත්වනු ලබන එක් දින, දෙදින, තුන්දින හා විශේෂ වැඩසටහන් සඳහා එම වැඩසටහන් පවත්වන දින හෝ ඊට පෙර ගෙවීම් කරන ලෙස ආයතනය විසින් සහභාගීවන්නන්ට දන්වා තිබුණ ද එය ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පැවැත්වූ වැඩසටහන් සඳහා ආයතන 08 කින් රු.92,000 ක් 2018 වර්ෂයේ මාර්තු වන තුරුත් අයකර ගැනීමට නොහැකි වී තිබූ බව නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ආ) ආයතනය විසින් පවත්වනු ලබන පාඨමාලා සඳහා පාඨමාලා පැවැත්වෙන දින හෝ ඊට ප්‍රථම ගෙවීම් කරන ලෙස ආයතනය විසින් ශිෂ්‍යයන් වෙත දන්වා තිබුණද ආදායම් එකතු කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනයේ පවතින දුර්වලතා හේතුවෙන් 2016 වර්ෂයේදී පවත්වා තිබුණු කෙටිකාලීන පාඨමාලා වෙනුවෙන් අයකරගත නොහැකි වූ පාඨමාලා ගාස්තු ලෙස රු.284,800 ක් කපාහැර තිබුණි.

(ඇ) හඳුනාගන්නා ලද ආදායම උපලබ්ධිවීම පිළිබඳ පසුවිපරම් ක්‍රියාවලිය දුර්වල මට්ටමක පැවති අතර පසුගිය වර්ෂ 03 ක විශේෂ වැඩසටහන්, ඩිප්ලෝමා පාඨමාලා, වැඩමුළු හා විභාග පැවැත්වීමෙන් ලැබිය යුතු රු.10,502,928 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අය කරගත නොහැකි වී තිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ කාන්තා ආයතනය (UN Women) සහ ශ්‍රම අධ්‍යනය ආයතනය අතර ඇතිකර ගත් ගිවිසුම ප්‍රකාරව 2016 අප්‍රේල් 1 සිට 2017 දෙසැම්බර් 31 දක්වා කාන්තාවන් සේවයේ යෙදීම පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කල යුතු විය. නමුත් ව්‍යාපෘති මුදලින් සියයට 72 ක් උපයෝජනය කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මූලික සමීක්ෂණ කටයුතු නිම වී නොතිබුණි. ඉහත ජාත්‍යන්තර ආයතනයේ මූල්‍ය රීති පිළිපැදීමට ආයතනය අපොහොසත් වීම මත ලබා දුන් අත්තිකාරම් මුදලින් රු. 558,263ක මුදලක් එම ආයතනය වෙත 2017 සැප්තැම්බර් 04 දින නැවත ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) ආයතනයේ ආරක්ෂක සේවාව සපයා ගැනීම සඳහා පෞද්ගලික ආරක්ෂක ආයතනයක් යොදාගෙන තිබූ අතර ගිවිසුම ප්‍රකාරව ගිවිසුම් කාලය 2017 ඔක්තෝම්බර් 16 දිනෙන් අවසන් වන නමුත් නැවත කාලය දීර්ඝ කිරීමකින් තොරව 2017 දෙසැම්බර් මාසය දක්වා සේවා ලබාගෙන එම කාලය සඳහා රු.247,990 ක මුදලක් ගෙවා තිබුණි.

## 4.4 අරමුදල් ඌන උපයෝජනය

ආයතනය විසින් රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යනු ලබන බැංකු ජංගම ගිණුමේ 2017 ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා රු.4,275,752 සිට රු.21,411,748 වූ පරාසයක ශේෂයන් පැවතුණි. 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 ඡේදය පරිදි හා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනතේ 4(ඉ) වගන්තිය ප්‍රකාරව අදාල පාර්ශවයන්ගේ නිසි අනුමැතිය ලබාගෙන අතිරික්ත මුදල් ආයෝජනය කර ආදායම් ඉපයීම කෙරෙහි ආයතනය අවධානය යොමුකර නොතිබුණි. එම චක්‍රලේඛයේ 4.2.5 ප්‍රකාරව ආයතනයේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර නොතිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

---------------------------------

2017 දෙසැම්බර් 31 වන විට ආයතන සඳහා අනුමත කාර්ය මණ්ඩලය 45 ක් වන අතර ආයතනයේ ඉහළ කළමණාකාරිත්වයට අයත් පුරප්පාඩු 03 ක් ද තෘතියික මට්ටමේ පුරප්පාඩු 07 ක් ද ද්විතියික මට්ටමේ පුරප්පාඩු 10 ක් ද ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 02 ක් ද වශයෙන් සේවක පුරප්පාඩු 22 ක් විය. සමාලෝචිත වර්ෂයේ දී මෙම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

----------------------

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කරගැනීම

-------------------------------------------------

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 " න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න දැනුවත් වී නොතිබුණි.

(අ) 2030 "න්‍යාය පත්‍රය" පිළිබඳව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු , ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා වියයුතු සංදිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---------------------------------------

## 6.1 අභ්‍යන්තර විගණනය

------------------------

මු.රෙ 133(ආ) පරිදි ආයතනයේ අභ්‍යන්තර විගණනය 2017 තුලදී කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය විසින් සිදුකරන නමුත් 2017 වර්ෂය තුලදි ආයතනය සම්බන්ධව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. ආයතනය සඳහා අනුමත කාර්ය මණ්ඩලය තුල අභ්‍යන්තර විගණන නිලධාරී තනතුරක් පවතින නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද එම තනතුර පුරප්පාඩුව පැවතුණි.

## 6.2 අයවැය ලේඛනමය පාලනය

---------------------------------

ආයතනයේ අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර සියයට 100 සිට 506 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිත කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 7. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍රය<br>--------------------------------- | | නිරීක්ෂණ<br>-------------- |
|---|---|---|---|
| (අ) | තොරතුරු තාක්ෂණ පොදු පාලනයන් | | ආයතනයේ පවත්වනු ලබන පාඨමාලාවන් සම්බන්ධයෙන් තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් පවත්වා නොතිබීම. |
| (ආ) | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | (i) | ලංසු විවෘත කිරීමේ දිනය, වේලාව, ස්ථානය සහිතව ලංසු කැඳවීමේ දැන්වීම් සකස් නොකිරීම |
| | | (ii) | ලංසු විවෘත කිරීමේ කමිටු අනුමත කර නොතිබීම |
| | | (iii) | ලංසු විවෘත කිරීම වාර්තා කිරීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමිත ආකෘති සහතික කර නොතිබීම හා කමිටු සාමාජිකයන් අත්සන් කර නොතිබීම |
| | | (iv) | ලංසු කැඳවීමේ ලේඛන ආයතනයේ අවශ්‍යතාවට නොගැලපෙන ලෙස කෙටුම්පත් කර තිබීම |